# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය**

**10 ශ්‍රේණිය** | **නර්තනය** | **14 - සන්නිවේදන කාර්ය සඳහා වාද්‍ය භාණ්ඩ යොදා ගැනීම**

- **ප්‍රශ්න අංක 01 සිට 16 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) ගමේ පන්සලේ බණක්, පිංකමක් පැවැත්වෙන බව සන්නිවේදනය කිරීමට වරින් වර වාදනය කරනු ලබන්නේ,

1) මඟුල් බෙර වාදනය යි. 2) අණ බෙර වාදනය යි.
3) හේවිසි වාදනය යි. 4) අත්‍යා බෙර වාදනය යි.

02) හේවිසි වාදනය සඳහා යොදාගන්නා ප්‍රධාන වාද්‍ය භාණ්ඩ මොනවාද?

1) දවුල, තම්මැට්ටම, හොරණෑව 2) දවුල, තම්මැට්ටම, හක්ගෙඩිය
3) ගැටබෙරය, දවුල, පන්තේරුව 4) ගැටබෙරය, දවුල, හොරණෑව

03) ආගමික කටයුතු සඳහා භාවිත වාදන විශේෂය කුමක්ද?

1) රබන් හා අණබෙර වාදන 2) හේවිසින හා රබන් වාදන
3) මළබෙර හා රබන් වාදන 4) හේවිසි හා තේවා වාදන

04) ''අණබෙර'' යනුවෙන් හඳුන්වනු ලබන්නේ,

1) ආඥාව පළකෙරෙන බෙර හඬ යන්නයි.
2) පාබල හමුදාවට අණදීම සනඳහා කරන වාදනයයි.
3) අතීතයේ පැවති බෙර විශේෂයකි.
4) දවුල සහ තම්මැට්ටම යොදාගෙන කරන වාදනයකි.

05) අණ බෙර සඳහා භාවිත කළ වාද්‍ය භාණ්ඩය කුමක්ද?

1) ගැටබෙරය 2) පහතරට බෙරය
3) පටහ 4) දවුල

06) ''මළ බෙර'' වාදනයෙන් උපදින රසය කුමක්ද?

1) ශෘංගාර 2) හාස්‍ය 3) භයානක 4) කරුණා

07) ''රණ බෙර'' වාදනයෙන් උපදින රසය කුමක්ද?

1) ශෘංගාර 2) උත්සාහ 3) වීර 4) රෞද්‍ර

08) ''වද බෙර'' වාදනයෙන් උපදින රසය කුමක්ද?

1) කරුණා 2) වීර
3) භයානක 4) අද්භූත

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

Agaram.LK - Keep your dreams alive!

09) දෙවියන්ට ආරාධනා කිරීමට හා ආශීර්වාද ලබාගැනීම පිණිස කරනු ලබන වාදනය නම්,

1) අණ බෙර වාදනය යි. 2) අත්‍යා බෙර වාදනය යි.

3) සුරල් පද වාදනය යි. 4) මඟුල් බෙර වාදනය යි.

10) සුදු පිරුවටයකින් වසා මළ බෙර වැයීම සඳහා යොදා ගනු ලබන්නේ,

1) රබාන 2) ගැටබෙරය

3) දවුල 4) යක්බෙරය

11) ''මළ බෙර'' වාදනය සඳහා යොදා ගනු ලබන්නේ,

1) දවුල සහ තම්මැට්ටම 2) දවුල සහ හොරණෑව

3) දවුල සහ පටහ 4) දවුල, තම්මැට්ටම සහ හොරණෑව

12) කඳු මුදුන්වල බැලුම්ගල් මත මුර කරන සෙබලු විශේෂ තොරතුරු මුරපොළෙන් මුරපොළට සන්නිවේදනය කරනු ලබන්නේ,

1) පණිවුඩ බෙර මාර්ගයෙනි 2) රණ බෙර වාදනයෙනි

3) රණ බෙර වාදනයෙනි 4) යුද බෙර වාදනයෙනි

13) අපරාධයක් හෝ රාජද්‍රෝහී කටයුත්තක් නිසා පුද්ගලයෙකු වධයට පැමිණවීමේදී ඒ බව ජනතාවට සන්නිවේදනය කළේ,

1) මළ බෙර වැයීමෙනි 2) අණ බෙර වැයීමෙනි

3) වද රෙ වැයීමෙනි 4) හේවිසි වැයීමෙනි

14) සටන් භූමියේ සිටින සොල්දාදුවන්ගේ රණකාමිත්වය ප්‍රකෝප කරවීම සඳහා වයන බෙර විශේෂය කුමක්ද?

1) අණ බෙර 2) පණිවුඩ බෙර

3) වද බෙර 4) රණ බෙර

15) පැරණි සිංහල රජවරු සතුරන්ට විරුද්ධව සංවිධානය විය යුතු බවට ජනතාව දැනුවත් කරන ලද්දේ,

1) පණිවුඩ බෙර මඟිනි 2) යුද බෙර මඟිනි

3) වද බෙර මඟිනි 4) ජය බෙර මඟිනි

16) රජ කෙනෙකු අභාවප්‍රාප්ත වූ කල්හි මඟුල් මඩුව ඉදිරිපිට පසෙකින් සිටගත් මිනිසෙකු මළ බෙර වාදනය කළ බව සඳහන් කරන දේශාටකයා කවුද?

1) ඉබන් බතුතා 2) ස්පිල්බර්ජන්

3) රොබ් නොක්ස් 4) ජෝන් ඩේවි

- **නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

17) යුද්ධයට යන හමුදාවේ මානසිකත්වය දිරිමත් කිරීම සඳහා අතීතයේ ................................................ වාදනය කරන ලදි.

18) අතීතයේ රජුගේ පණිවුඩය ජනතාව අතරට ගෙන යාමේදී ................................................ වාදනය කරන ලදි.

19) ශ්‍රී මහා බෝධියේ කොටසක් දිරාපත් වූ විට එය ආදාහනය කිරීමේදී ................................................ නම් බෙරය වාදනය කර ඇති බව ................................................ වංසයේ සඳහන් වේ.

20) තේවා හේවිසි, පූජා හේවිසි, ධූර හේවිසි, පෝය හේවිසි වැනි වාදනාංග ................................................ සන්නිවේදන වාදන අවස්ථා ලෙස හැඳින්විය හැකිය.

21) සාම්ප්‍රදායික හේවිසි වාදනයේදී සුසිර භාණ්ඩයක් ලෙස ................................................ යොදා ගනී.

22) දළදා කරඬුව අඹරාව යටින් පිටතට වැඩමවීමේදී ................................................ හේවිසි නමින් හේවිසි වාදනයක් ද නැවතක දළදා වහන්සේ මාලිගාව ඇතුළත වැඩමවීමේදී ................................................ හේවිසි නමින් හේවිසි වාදනයක් ද පැවැත්වේ.

23) පුරාණ රාජ්‍ය පාලන කටයුතුවලදී ප්‍රධන සන්නිවේදන මාධ්‍ය වූයේ ................................................ වාදනයයි.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

- **පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

24) සන්නිවේදන කටයුතු සඳහා භාවිත කළ හැකි වාද්‍ය භාණ්ඩ 04 ක් නම් කරන්න.

25) සමාජීය සන්නිවේදන කටයුතු සඳහා දේශීය වාද්‍ය භාණ්ඩ භාවිතා කළ අවස්ථා 04 ක් නම් කරන්න.

26) ඉන් අවස්ථා 03 ක් පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.

27) වර්තමානයේ විවිධ සමාජ අවශ්‍යතාවල දී වාද්‍ය භාණ්ඩ යොදාගන්නා අවස්ථා 03 ක් සඳහන් කරන්න.

28) මළබෙර වාදන අවස්ථාව හා බැඳි වාදන විධික්‍රම පිළිබඳ හැඳින්වීමක් කරන්න.

29) ආගමික කටයුතු සඳහා දේශීය වාද්‍ය භාණ්ඩ භාවිත කළ අවස්ථා 02 ක් නම් කරන්න.

30) ආගමික කටයුතු සඳහා යොදාගත් දේශීය වාද්‍ය භාණ්ඩ මොනවාද?

31) අතීතයේ දේශීය වාද්‍ය භාණ්ඩ උපයෝගී කර ගනිමින් පවත්වන ලද උත්සව 04 ක් නම් කරන්න.

32) වාදන අවස්ථා සඳහා දේශීය තූර්ය භාණ්ඩ භාවිත කිරීමේ අරමුණු 04 ක් ලියන්න.

33) දේශීය තූර්‍ය භාණ්ඩ වාදනය කරණ කොට ගෙන රස උත්පාදනය වන අවස්ථා මොනවාද?

34) සන්නිවේදන කාර්යය සඳහා දවුල යොදාගෙන ඇති අවස්ථා මොනවාදැයි පෙන්වා දෙන්න.

35) ආගමික කටයුතු සඳහා හේරී වාදනය යොදා ගත් බට ඓතිහාසික සාධකයක් ඉදිරිපත් කරන්න.

36) සමාජීය කටයුතු සඳහා හේරී වාදනය යොදා ගත් බවට ඓතිහාසික සාධකයක් ඉදිරිපත් කරන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

සැකසුම:- නවමල් ජයවීර මයා